රුහුණ විශ්වවිද්‍යාලය

**2015/2016 ශාස්ත්‍රවේදී (සාමාන්‍ය/විශේෂ) උපාධි - 3000 ස්ථලය**
**දෙවන සමාසික පරීක්ෂණය - 2017 මාර්තු**

## SLS 32543/32643 – මාධ්‍ය අධ්‍යයනය

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

කාලය : පැය 03

---

1. "සන්නිවේදන ක්‍රියාවලිය පිළිබඳව පසුකාලීනව ඉදිරිපත් වූ ආකෘති වඩා විග්‍රාහාත්මක ස්වරූපයක් උසුලයි." උක්ත ප්‍රකාශයේ නිරවද්‍ය බව කාලීන නිදසුන් ඇසුරින් පරීක්ෂා කරන්න.

2. පහත සඳහන් මාතෘකා පිළිබඳ කෙටි සටහන් ලියන්න.
   i. නිර්වාග් සන්නිවේදනය (Non-verbal Communication)
   ii. සන්නිවේදන ක්‍රියාවලිය (The Communication Process)

3. පුවත් පතක අන්තර්ගතය හා ආකෘතිය සමබරව පවත්වා ගැනීමේදී අවධානය යොමු කළ යුතු අංශ පිළිබඳ පරීක්ෂා කරන්න.

4. ජනමාධ්‍ය ආයතනයක් ප්‍රවෘත්ති සන්දේශයක් ගොඩනැගීමේදී අවධානය යොමු කළ යුතු විවිධ අංශ පිළිබඳ විග්‍රහාත්මක සාකච්ඡාවක් කරන්න.

5. පහත සඳහන් ගුවන්විදුලි වැඩසටහන් ආකෘති යුගල අතුරින් **එක් යුගලයක්** තෝරා ගෙන ඒවායෙහි ඇති දුබලතා හා ප්‍රබලතා පිළිබඳව සැසඳීමක් කරන්න.
   i. ගුවන්විදුලි වාර්තාංග හා විචිත්‍රාංග
   ii. ගුවන්විදුලි සජීව විස්තර කථනය හා ඇසින් දුටුවකුගේ විස්තරය
   iii. ගුවන්විදුලි සම්මුඛ සාකච්ඡාව හා ගුවන්විදුලි කථාව

6. ශ්‍රවණ පර්යේෂණ ක්‍රියාවලිය ගුවන්විදුලි වැඩසටහන් සම්බන්ධයෙන් වැදගත් වන්නේ කෙසේදැයි සඳහන් කොට ශ්‍රවණ පර්යේෂණ විධි කිහිපයක් විමසීමට ලක්කරන්න.

7. ප්‍රවෘත්ති යනු කුමක්දැයි අර්ථකථනය කොට රූපවාහිනී ප්‍රවෘත්ති වාර්තාකරණයෙහි ප්‍රතිමාන පිළිබඳව සමාලෝචනයක් කරන්න.

8. රූපවාහිනී වෙළඳ දැන්වීම්වල සමාජ බලපෑම පෙන්වා දෙන්න.

************************************



210